# හරය


ඇතුල් පිටු

විපක්ෂයේ හුළං බැස්සේ ඇයි?

දෙමළ කොල්ලයට සම්බන්ධනුත් හවුල්

ඩයස්පෝරාව පාවා දුන් හෝරාව



2010 ජූලි

ජන රැල්ලේ නොසැලෙන හඬ

පුවත්පතක් ලෙස ලියාපදිංචි කරන ලදී.

27 වන කාණ්ඩය. 03 වන කලාපය


# මහින්ද මිසයිල් ප්‍රහාර අරඹයි

## බඩු IMF එකෙන්

බදු බර මගින් වැඩ කරන ජනතාවගේ මූර්ථ අදායම් කප්පාදු කිරීම ඔස්සේ රේක්ක කරගන්නා ආදායම් මගින්, හා රාජ්‍ය සේවාවන් කප්පාදු කර ඉතිරිකර ගන්නා මුදලින් අය වැය හිඟය දල ජාතික ආදායමෙන් 5% දක්වා පහළ හෙලීමට අවශ්‍ය පියවර ගැනීම ස්ථිර කළා වූ මෙවර අය වැය ගෝලීය ප්‍රාග්ධනයේ අවශ්‍යතාවන් සපුරාලන්නක් බව ආර්ථික විශේෂඥයන් විසින් පෙන්වා දී තිබේ. වැඩ කරන ජනතාව හා දුප්පතුන් වළ පල්ලට යවන්නා වූ අයවැයක් වන මෙය මුළුමණින්ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් සකසා මහින්ද රජය විසින් ප්‍රකාශයට පත් කරන ලද්දකැයිද දේශපාලන විශ්ලේෂකයින්ගේ මතයයි.

නියෝජ්‍ය මුදල් අමාත්‍ය සරත් අමුණුගම විසින් මෙම අය වැය පාර්ලිමේන්තුවේ ප්‍රකාශයට පත් කිරීමට පෙරම ඒ සම්බන්ධයෙන් තම ප්‍රසාදය පල කළ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) පෙන්වා දී තිබුනේ ශ්‍රී ලංකා රජය ආයෝජකයන්ට හිතවත් අයවැයක් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන බවත්, ඒ අනුව විදේශ විනිමය අර්බුදයට සහන ලෙස තමන් ලබා දුන් ණය මුදලේ තුන්වන කොටස වන ඩොලර් මිලියන 2.6 නිදහස් කරණ බවත් ය. IMF ය මේ ණය කොටස රඳවා ගෙන තිබුණේ අයවැය හිඟය දළ ජාතික නිෂ්පාදිතයෙන් 7% දක්වා අඩු කිරීමට අවශ්‍ය පියවර එනම්, ජනතාවගේ ජීවන මට්ටම් කප්පාදු කර දේශීය වශයෙන් ආදායම් වැඩිකර වියදම් අඩු කිරීමට පියවර නොගැනීම නිසා ය. නමුත් මෙම අයවැයේ දී ත් මෙම හිඟය 8% ක ට වැඩි මට්ටමක තිබිය දී ත් මේ ණය නිදහස් කරන ලද්දේ ඒ දිසාවෙන් කටයුතු ඇරඹීම ට අය වැයට පෙර දී ම පියවර ගනිමින් අත්‍යාවශ්‍ය භාණ්ඩ වලට බදු වැඩි කරගැනීම මගින් එකී IMF ප්‍රතිපත්තිය ක්‍රියාවට ලන බව ප්‍රායෝගිකවම ආණ්ඩුව විසින් ඔප්පු කරන ලද නිසා බව ද ආර්ථික විශ්ලේෂකයෝ පෙන්වා දෙති. ඒ අතර විමුක්ති කොටි පරාජය මගින් තමන් ලද ජයග්‍රහණය මැතිවරණ මට්ටමෙන් ස්ථිර කර ගැනීමට සිදු වූ නිසා ඒ කාලය තුළ යම් සහන තත්ත්වයක් පවත්වාගෙන යෑමට සිදු වී තිබීමේ යුක්තිසහගත භාවය IMF නියෝජිතයන්ට ඒත්තු ගැන්වීමට ආණ්ඩුව සමත් වී තිබීමද මේ තීරණය පසු පස ඇති බව දේශපාලන විචාරකයන්ගේ මතයයි.

මේ අය වැය සැකසීමේ දී නේවාසික ඡළුත නියෝජිතයන් සහභාගී වී සිටි නිසාම


................පස් වන පිටුවට




ජනාධිපති රාජපක්ෂ කලාපීය බලවතා සමග

## යාපනයේ වැන්දඹු කාන්තාවන් ආණ්ඩුවටත්, දෙමළ සමාජයටත් එපාලු!

### "ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා මාධ්‍යවේදියෝ" කියයි.

සිවිල් යුධයේ අහිංසකම ගොදුරු බවට පත්ව සිටින තම ස්වාමිපුරුෂයන් අහිමි කරනු ලැබූ දස දහස් ගණන් උතුරේ කාන්තාවන් ගේ ඉරණම සම්බන්ධයෙන් ලංකාණ්ඩුව මෙන්ම දෙමළ සමාජයත් දක්වන්නේ උදාසීන පිළිවෙතක් බව ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා මාධ්‍යවේදියෝ (JDS) සංවිධානය අවධාරණය කර තිබේ.

යාපනයේ සංචාරයේ යෙදෙන අයට එහි සුන්දර පරිසරයත්, නගරය ක්‍රමයෙන් නවීකරණය වන අයුරුත් පෙනී යා හැකි මුත්, එහි මිනිසුන්ගේ ජීවිත ගැන උනන්දු වන්නකුට වෙනත් පිංතූරයක් දැකිය හැකි බව JDS සංවිධානය කියයි. "යුද ගැටුම් හේතුවෙන් බොහෝ කාන්තාවන් ස්වාමිපුරුෂයන් අහිමි වූවන් බවට පත්කර තිබෙනවා. ඔවුන් ට උදව් කිරීමට හෝ ආරක්ෂාව සැලසීමට ආණ්ඩුවට හෝ ප්‍රදේශයේ මහජන ආයතන වලට හෝ සැලැස්මක් නෑ. ඇත්ත වශයෙන්ම මේ බොහෝ කාන්තාවන්ට දරුවන් හතර පස් දෙනා බැගින් ඉන්නවා. ඔවුන් නඩත්තුවට විවිධ කුලී වැඩ කරන්න සිදු වී තිබෙනවා. සමහර විට දරුවන්ට ඉන්නට සිදු වී තිබෙන්නේ කුස ගින්නේ. සමහර පුද්ගලික කණ්ඩායම් පමණක් වෑයම් කරනවා ඔවුන්ට යම් වෘත්තියක් සොයා දෙන්නට....."

මේ අතර කාන්තා සංස්කෘතික මධ්‍යස්ථානයේ (WCC) සම්බන්ධීකාරිණී සුබාජිනී තුරෙයිරාජා ඒෂියා නිව්ස් ආයතනයට පවසා ඇත්තේ යාපනය අර්ධද්වීපයේ වැන්දඹුවන් 26,300 ක් සිටින බවයි. ඒ අතර තවත් දස දහස් ගණනක් මෙවැන්නියන් උතුරු හා නැගෙනහිර පළාත් වලින් හමුවන බවත්, ඔවුන් විශේෂයෙන් දෙමළ හා මුස්ලිම් බවත් ඇය පවසා ඇත. ඇය තව දුරටත් පවසා ඇත්තේ මේ කාන්තාවන්ට ශ්‍රී ලංකා සොල්දාදුවන්ගෙන් විවිධ කරදර ද පවතින බවයි. සමහරු මොවුන්ට විවාහ යෝජනා පවා කරනු ලබන මුත් තාවකාලිකව මේ ප්‍රදේශ වල සේවය කරන මේ අයගේ උවමනාව තාවකාලික වින්දනයක් ලැබීම පමණක් බව ඇය පවසා ඇත. මේ කාන්තාවන් මුහුණ පා සිටින අවාසනාවන්ත තත්ත්වය ඉදිරියේ ඔවුන් සම්බන්ධයෙන් ගරු කටයුතු අයුරින් හැසිරෙන ලෙසත්, අයුතු ප්‍රයෝජන ගැනීමට ක්‍රියා නොකරන ලෙසත් ආණ්ඩුව තම සොල්දාදුවන් දැනුවත් කිරීම ඉතාම වැදගත් වන බව ද ඇය සඳහන් කර ඇත.

ඇය මෙසේ ද පවසයි. ".....ඔවුන් තවමත් ජීවත් වන්නේ යුධයේ කෲරතර සිදුවීම් පිළිබඳ කම්පනයෙන්. විශේෂයෙන් බොහෝ විට තමන් ඇස්පනා පිට තමන්ගේ සැමියන් මියගිය


................අට වන පිටුවට


## තමිල්නාඩු දේශපාලන නායකයා 21 වන සියවසේ ඊඩප්පන් කෙනෙක්

### මහාචාර්ය රාමස්වාමි

දෙමළ ඊළාමය ලබා ගැනීම සඳහා මූලික පූර්ව අවශ්‍යතාවයක් වන්නේ, තමිල්නාඩුවෙන් අරඹා, ලෝවාසී දෙමළ ජනතාවගේ සිත්සතන් හරහා යන දේශපාලන පරිවර්තනයක් බව මහාචාර්ය රාමස්වාමි ටැමිල් නෙට් වෙබ් අඩවිය සමඟ කළ සාකච්ඡාවක දී පවසා තිබේ. මහාචාර්ය පී. රාමස්වාමි මැලේසියාවේ පීනෑං ප්‍රාන්ත රාජ්‍යයේ නියෝජ්‍ය මහ ඇමති වෙයි.

තමිල්නාඩුව තම සම්ප්‍රදායික DMK හා AIDMK නායකත්වය ඉක්මවා ලෝවාසී දෙමළ ජනතාවගේ ඉරණම තමන් අතට ගත යුතු බවත්, ලංකාවේ දෙමළ සංවිධානයන්ට කිසිම දැක්මක් නැති බවත්, සමහරු ඉංදියාව විසින් මෙහෙයවන බවත්, බටහිර වෙසෙන සමහර දෙමළ පිරිස්වලට ඊළාම් දෙමළ ජනතාවගේ ජාතික විමුක්තියේ ඓතිහාසික හා නූතන ගමන් මග පිළිබඳව අවබෝධයක් නැති බවත් ඔහු අවධාරණය කර තිබේ. ඔහු වැඩි දුරටත් පවසා ඇත්තේ මේ අවස්ථාවේ දී සිංහල රාජ්‍ය සමඟ දෙමළ ප්‍රශ්නය ගැන සාකච්ඡා කිරීම අසාධනීය ප්‍රතිඵල ලබා දෙන්නක් වන බවත්, තමන් විසින් ඉංදියාව හා තමිල්නාඩුවේ DMK නායකත්වය විසින් කරන ලද නොමග යැවීම් හෙළිදරව් කිරීමට කටයුතු කරන බවත්, ඒ හා සමඟම ලංකාවේ යුධ අපරාධ හා ඒ සඳහා ඉංදියාව විසින් ඉටු කරන ලද බලවත් වැඩකොටස සම්බන්ධයෙන් ජාත්‍යන්තර පරීක්ෂණයක් සඳහා බලපෑම් කරන බවත් ය.


................අට වන පිටුවට


## CIC සමාගමට රක්ෂිත වනාන්තර දෙකක් බිළි

බහුජාතික සී.අයි.සී. සමාගම හා ශසෙනෝ කෝකු සමාගම ඒකාබද්ධව ගෙන යෑමට බලාපොරොත්තු වන කෙසෙල් වතු ව්‍යාපාරයක් සඳහා කන්තලේ ප්‍රදේශීය ලේකම් කොට්ඨාශයේ වුන්ඩන්කාඩු රක්ෂිත වනය හා එම ප්‍රදේශයේම පිහිටා ඇති තවත් යෝජිත රක්ෂිත වනයක් පවරා දීම මගින් මේ ව්‍යාපෘතිය සඳහා ඉල්ලා ඇති අක්කර 15,000 ක භූමි ප්‍රමාණය සම්පූර්ණ කර දීමට කැබිනට් අනුමැතිය ලබා දී තිබේ.

මේ දවැන්ත භූමි ප්‍රමාණය වසා කෙසෙල් වගා කරනුයේ අපනයනය සඳහා ය. මේ ව්‍යාපෘතිය මගින් ප්‍රදේශයේ ජනතාවට රැකියා 1000 ක් ලැබෙන බවත්, ඒ අතරම ලංකා ආර්ථිකය ශක්තිමත් කිරීමට එය දායක වන බවත් කියති.

ඒ අතර මේ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරන ශ්‍රී ලංකා හරිත ව්‍යාපාරය පෙන්වා දෙන්නේ මේ ව්‍යාපෘතිය නිසා සිදුවන ආර්ථික හා පාරිසරික විනාශය ඊට වඩා වැඩි බවයි. ඔවුන් පෙන්වා දෙන අයුරු සූරියවැව ආදී කෘෂිකර්ම කටයුතු සඳහා ජලය ගබඩා කරගන්නා වැව් රාශියක් මෙයින් විනාශ වන බවය. අනෙක් පැත්තෙන් සෝමාවතී ජාතික වනෝද්‍යානයේ සිටි සංක්‍රමණය වන අලි 100 කට ආසන්න ප්‍රමාණයක් නිරන්තර ගැවසෙන මෙම වන ගහනය විනාශ වීමත් සමඟ ඔවුන් ගැමියන්ගේ වගා බිම් වලට පැමිණීමෙන් මහත් විනාශයක් වන බවයි. අලි මිනිස් ගැටුම තව දුරටත් වර්ධනය වන බවයි.


................අට වන පිටුවට


## උතුරේ අවතැන් වූවන් වහා සිය ගම්බිම්වල පදිංචි කරවි !